දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තම්ළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තම්ළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තම්ළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තම්ළිනීගේ කතාව 20

2004 වසරේ අවසානයේ සුනාමියෙන් පීඩවට පත් එම ජනතාවට උපකාර කිරීම සඳහා යෑමට අවස්ථාව ලැබුණු විට මම මහත් සතුටට පත්වුණෙමි. මම තවත් සටන්කාමී සාමාජිකයන් කීප දෙනෙකු ද ස්වෙච්ඡා සේවකයන් කීප දෙනෙකු ද එක්කරගෙන නැඟෙනහිර පළාත බලා පිටත් වූයෙමි. සටන් විරාම ගිවිසුම පැවැති කාලයේ රජයේ පාලනයෙහි පවතින ප්‍රදේශවල ප්‍රධාන මාර්ගයෙන් අපි නැඟෙනහිර පළාතට යන්නේ නම් අපි යා යුත්තේ හමුදාවේ මඟ පෙන්වීම් යටතේ බව සටන් විරාම ගිවිසුමේ වගන්තියක් විය. එසේ යන අයගේ නම්, තහඩු අංක, කොටි සංවිධානයේ හැඳුනුම්පත් අංකය ආදිය සමඟ වවුනියාවේ පිහිටි ඕමන්දෙ මුර පළෙන් පිටත්වන වේලාව, ගමනාන්තය ආදී විස්තර කිලිනොච්චියේ පිහිටි කොටි සාම ලේකම් කාර්යාලයේ සිට කොළඹ සාම ලේකම් කාර්යාලයට යවා ඒ සඳහා වන අනුමැතිය ලැබුණු පසුව පමණක් පිටත් විය හැකිය.

එහෙත් ඒ සඳහා වන කාල අවකාශය අපිට නොමැති හෙයින් වවුනියාවේ දේශපාලන කාර්යාලයට යන බවට ඕමන්දෙහි ලියාපදිංචි වී කෙළින්ම මඩකලපුවට යාමට තීරණය කළෙමි. ඒ අනුව එයට ගැලපෙන ලෙසින් සමාන්‍ය කාන්තාවන් සේ වවුනියාවේදී ඇඳුම් ඇඳ ගත්තෙමු. අපේ වාහනයට සහ රියදුරන්ට අවශ්‍ය නීත්‍යානුකූල ලියකියවිලි තිබූ හෙයින් එදින ගමන කිසිම බාධාවකින් තොරව සිදුකළ හැකි වීය. ‘සුනාමි සහනාධාර’ යන බැනරය සමඟ නැඟෙනහිර බලා ගමන් කළ සහනාධාර ලොරි ද අපට පිටුපසින් කිසිදු ගැටළුවකින් තොරව පැමිණෙමින් තිබුණි.

## භාෂාව නොදැනීමෙන් ඇතිවූ දබරය

අප මඩකලපුව දේශපාලන කාර්යාලයට ගිය මොහොතේ දේශපාලන අංශය භාරව සිටි කෞෂල්‍යන්, නැඟෙනහිර පළාත් සෙන්පති භානු යන අයව හමුවීමට හැකිවීය. අප ගොස් ඔවුන්ව හමුවීමට පෙරම ඔවුන්ට කිලිනොච්චියෙහි සිට තොරතුරු දැනුම්දී තිබුණි. ඔවුහු එහි සිටි සටන්කාමීන් සමඟ සුනාමි සහනාධාර කටයුතුවල යෙදී උන්හ. වහාම සමහර කරුණු පිළිබඳව කතා බස් කරගැනීමෙන් පසුව මම අම්පාරේ තිරුක්කෝවිල්වලට යෑමට පිටත් වූයෙමි. සුනාමි ආපදාව අම්පාරේ මුහුදුබඩ ප්‍රදේශ ඉතාමත් දරුණු ලෙසින් පීඩාවට පත්කර තිබිණි. එහි ගොස් සේවය කිරීම මට පවරා තිබුණි.

අපේ කණ්ඩායම අම්පාරේ තිරුක්කෝවිල්, තම්බුලුවිල් යන ප්‍රදේශවලට ගිය අවස්ථාවේ දෙමළ පුනරුත්ථාපන සංගමයෙහි සම්බන්ධීකාරක සහ ස්වෙච්ඡා සේවකයන් ද දේශපාලන අංශයෙහි සටන්කාමීහුද එහි උන්හ. අප ගෙන ගිය සහනාධාර ද්‍රව්‍ය දේශපාලන ලේකම් කාර්යාලයට ආසන්නයේ වූ තම්බුලුවිල් පාසලේ ආරක්ෂා සහිතව බෑමට අවශ්‍ය කටයුතු කළෙමු. රාත්‍රී ළඟා වී තිබූ හෙයින් අප සමඟ පැමිණ සිටි සටන්කාමී සහෝදරයෝ සහ ස්වෙච්ඡා සේවකයෝ පාසලෙහි නතර වූහ. තිරුක්කෝවිල් ප්‍රදේශයේ දේශපාලන අංශයේ කාන්තා අංශයේ කාර්යාලයක් නොවූ හෙයින් අපට නතර වීමට ස්ථානයක් ඉක්මනින් සොයා ගැනීම අපහසු වීය. තිරුක්කෝවිල් ප්‍රදේශය මුහුදුකරයට ඉතාමත් ආසන්න ප්‍රදේශයක වූ හෙයින් එම ප්‍රදේශයේ බිහිසුණු විනාශයක් සිදුව තිබුණි. එමෙන්ම නැවතත් සුනාමි මුහුදු රළ පැමිණිය හැකිය යන බිය නිසා පීඩාවට පත් නොවූ ප්‍රදේශවල ජනයා පවා අවතැන්ව වෙනත් ස්ථානවලට ගොස් සිටියහ.

උදෑසනම අපේ වැඩකටයුතු ආරම්භ කළ යුතු හෙයින් පාසළ අසළ වූ ළිඳක් සහ වැසිකිළියක් සහිත නිවෙසක ආලින්දයෙහි කාන්තා සටන්කාමීහු රාත්‍රිය ගත කිරීමට තීරණය කළහ. මහත් වෙහෙසකින් සහ කුසගින්නකින් සිටි සටන්කාමී සහෝදරියන්ගෙන් එක් අයෙක් ඇහැරී මුරට සිටිද්දී අනෙක් අය නිදාගන්නා අයුරින් මාරුවෙන් මාරුවට පිරිස නිදා ගත්හ. අපි එහි වූ කුප්පි ලාම්පුවක් දල්වා තැබුවෙමු. සුළඟට එහි දැල්ල සෙළවෙයි. අඛණ්ඩවම වැස්ස ඇද වැටෙමින් තිබිණ. දහස් ගණනක ජීවිත බිලිගත් මුහුදු රාක්ෂ හඬින් හුස්ම ගනිමින් තිබේ.

එම සුළඟ වේගයෙන් හමද්දී බඩ දඟලන දුගඳක් පැතිරෙන්නට වීය. සමාන්‍යයෙන් සෞඛ්‍ය සම්පන්න බවින් අඩු ස්ථානයන්හි මට බොහෝ විට නින්ද යන්නේ නැත. සුනාමි ආපදාව ඇතිවූ මොහොතේ සිට එම මොහොත දක්වාම සිදුවීම් මගේ සිතේ එකින් එක මැවෙන්නට විය. නාඳුනන ප්‍රදේශයක සහනාධාර කටයුතු සිදුකරන්නේ කෙසේද යන සිතුවිලි සිතේ පොර බඳන්නට වීය. අම්පාරෙහි දෙමළ ජනතාවගේ ජනාවාස බොහෝ ලෙසින්ම මුහුදුබඩ ප්‍රදේශවල පිහිටි හෙයින් ගමන් මඟේදීම සුනාමි ආපදාවෙහි විනාශයන් වටහා ගත හැකිවීය. මගේ ජීවිතයේ මෙයට පෙර කිසි දිනෙක නොදුටු ලෙසින් කළුපාටට බෙංගාල මුහුද උදම් අනමින් සිටිනු දුටු දර්ශනය මහත් බිය ජනක විය.

ජනතාව පාසල්වලටත්, මඳක් උස් කඳුකර ප්‍රදේශවලටත් සරණ පතා ගොසින්ය. රජයේ පාලනයට අයත් ප්‍රදේශයක් වන එහි ලංකාවේ හමුදාව ද ජනතාව මුදාගැනීමේ කටයුතුවල සහ සහනාධාර කටයුතුවල නිමග්නව උන්හ. හමුදා වාහනවල ආහාර පාර්සල් ගෙවිත් ජනතාවට බෙදා දෙනු දක්නට ලැබිණ. තවත් පැත්තකින් අපේ ස්වෙච්ඡා සේවකයෝ ද සටන්කාමීහු ද ආහාර පිස ජනතාවට බෙදා දීමට විශාල භාජන සොයා යද්දී රාජ්‍ය නොවන සංවිධානයක සිංහල සේවකයන් විශාල ඇලුමිණියම් භාජන වාහනවලින් ගෙනැවිත් බිමට බානු මම දුටුවෙමි. එකම එක සිංහල වචනයක්වත් කතා කිරීමට නොහැකි තත්ත්වයක් යටතේ පවා එම භාජනවලින් කීපයක් අපට දෙන මෙන් බැගෑපත්ව ඉල්ලා සිටියෙමි. අපි සටන්කාමී සාමාජිකාවන් බව දැනගත් සමහරු අප දෙස විශ්මයෙන්



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com